# මල් ගැන තතු



කෞෂල්‍යා වොන්හාට්
ග්ලේන් වේවලි



මල් ගැන කතා කරනවිටම ආදරය ගැනද සඳහන් නොකරම බැරිය. මල් හා ආදරය අතර ඇත්තේ ඉතා දැඩි සබඳතාව පෙම්වතුන්ගේ දවස නැත්නම් 'වැලන්ටයින් ඩේ' සැම පෙම්වතී රෝස මලක් ලැබීම පුදුමයක් නොවේ. තවද "ආදරය" නිහඬව ප්‍රකාශ කිරීමටද රෝස මලකට හැකියාව තිබේ. යෞව්වනයන්ට "ආදරය" බෙහෙතක් වැනිය. එලෙසම මනසට මල් බෙහෙතක් ව.... මනසින් විහිදෙන සුවඳ මනස ප්‍රබෝධමත් කරන අතර දෑසට ප්‍රීතියද ගෙනදේ.

රෝහලේ ගතකරන කාලයතුල, දරුවකු බිහිවීමෙන් පසු මවටද උපන්දිනයකදීද, මව්වරුන්ගේ දිනයේදීද, පියවරුන්ගේ දිනයේදීද, තරඟ විභාග ආදියේ ජයග්‍රහණවලදීද, ප්‍රභූවරුන් පිලිගැනීම්වලදීද, පූජනීය අවස්ථාවලදීද, උත්සව හා කලාකටයුතුවලදීද, රෝග අවස්ථාවලදී, ඖෂධ සඳහාද, යන්ත්‍ර මන්ත්‍ර ආදී කටයුතු වලදීද, ඇඳුම්වල පැළඳීමෙන් මංගල උත්සව හා අනිකුත් සුභ කටයුතු වලදීද, කාන්තාවන්ගේ හිසකෙස් අලංකාරය සඳහා පැළඳීමෙන්ද, අවසාන වශයෙන් අවමංගල උත්සව වලදීද මෙම මල් භාවිතයට ගනී.

දුකට හා සැපතට මල් නිතර ජීවිතයේ බොහෝ අවස්ථාවලදී මල් වගී යොදා ගන්නා අතර එයින් ප්‍රිය උපදවන සංකේතයකි. පැරණි මතය අනුව මල් පොකුරක ඇත්තේ ඔත්තේ ගනන.... නම් එය සුභ ලකුණකි.

ලෝකයේ විවිධ රටවල විවිධ ආකාරයේ මල් සංකේතවත් කරයි. උදාහරණයක් ලෙස "REONY" මල චීන ජාතිකයන් සළකන්නේ මෙය ප්‍රීතිය හා දීර්ඝායුෂ සංකේතවත් කරන මලක් ලෙසය.

තවද මැග්නෝලියා, ඕර්කිඩ්, ලෝටස් සහ ක්‍රිෂාන්ති මල් චීනයේ ඉතා ජනප්‍රිය මල්වර්ග ලෙස සැලකේ.

ඩේසි මල අහිංසකත්වය සංකේතවත් කරයි. මෙය ඉංග්‍රීසි ජාතීන්ගේ විශ්වාසයයි. නමුත් ඇමරිකානුවන් දරන්නේ ඊට හාත්පසින්ම වෙනස් මතයකි. "ඩේසි මලේ " අර්ථය "සලකා බලන්නම්" හෝ "සිතා බලන්නම්" යන්නයි. (I will think about it)

මලක පැහැය, හැඩය සහ සුගන්ධය ඉන්ද්‍රියන් හා හිත සනසයි මල් වර්ග හිසේ පලඳින විට හා අතේ තිබෙන විට විවිධ අර්ථ දක්වයි.

මල් පොකුරක් උඩ අතට අල්ලා සිටීනම් එය "සුභ ආරංචියකි මල් පොකුරක් පහතට අල්ලා සිටීනම් එය "අශුභ ආරංචියයි.

වර්ෂ ගනනාවක් පුරා මල්වලින් ප්‍රකාශ කරන අදහස් වැඩි දියුණු වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් මිනිස් වර්ගයාගේ හැඟීම් සහ සිතුවිලි ප්‍රබාශ කිරීමට මල් උපකාර වී ඇත. සැම මලක්ම විවිධ අර්ථ සංකේතවත් කිරීම පුදුමයක් නොවෙයි සැම මලකම සැඟවුණු අර්ථයක්ද, ගුණයක්ද, සුවඳක් පාටක්ද ඇත. මේ නිසා මල් පොකුරක් තිළින කරනවිට එහි අර්ථය දැනගෙන තිළිණ කිරීම ඉතාම වැදගත්ය. උදාහරණයක් ලෙස සුදු ලිලී (LILY) මල පිරිසිදු බව හා අහිංසකත්වය සංකේතවත් කරයි.

විවිධ ප්‍රදේශ විවිධ දේශ ගුණය, විවිධ රටවල හා විවිධ ස්වා.භා-වික තත්වයන් මත විවිධ මාදිලියේ මල්වර්ග රෝපනය වේ. එයද ඒ ඒ ප්‍රදේශයට අනුව පාවිච්චියට ගතයුතු හා තිළිණ කළ යුතු ක්‍රියාවකි.

විශේෂයෙන් සැම මසකටම අදාල මල් වර්ග ඇත. ඔබගේ ජීවිතයේ ප්‍රීතිය, ආදරය සහ වාසනාව යෙදෙන්නේ කුමණ මල් වර්ගයක් කියා හඳුනාගෙන ඉදිරියේදී එයට ප්‍රතිචාර දැක්වීමෙන් ඔබටම ලැබෙන තෘප්තිය අතිමහත්.

| | |
|---|---|
| ජනවාරි මසට | කානේෂන් (CARNATION) ප්‍රිම්රෝස් (PRIM-ROSE) |
| පෙබරවාරි මසට | ප්‍රිම්රෝස් (PRIMROSE) |
| මාර්තු මසට | ඩැෆඩිල් (DAFFODIL) |
| අප්‍රේල් මසට | ඩේසි (DAISY) |
| මැයි මසට | හෝනෝර්ස් (HAWHORN) |
| ජූනි මසට | රෝස් (ROSE) |
| ජූලි මසට | වොටර් ලිලී (WATER LILY) |
| අගෝස්තු | ග්ලැඩිඕලි (GLADIOLI) |
| සැප්තැම්බර් මසට | ඇස්ටර් (ASTER) |
| ඔක්තොම්බර් මසට | ඩහලියා (DAHLIA) |
| නොවැම්බර් මසට | ක්‍රිෂාන්ති මම් (CHRYSANTHE MUM) |
| දෙසැම්බර් මසට | හෝලි (HOLLY) |

මීට අමතරව විවිධ ජාතීන්ට ආවේනික වූ විශේෂ මල් වර්ග බහුලව ඇත. සෑම මලකින්ම සතුට, සොම්නස හා මානසික සුවය හා ශාරීරික සුවය ලැබෙන්නේනම් එය ඉතා අගේකොට සැලකිය යුතුයි.

# සුදාර ද සිල්වා ගේ සිහල ජන ගී













සේයා රූ - විජිත කුමාර

# මාලනී ජයසිංහ උපහාර කෙටි නාට්‍ය උළෙලින්



විප්‍රවාසී මහල්ලා - සුසාම ගමගේ



Our Nothing - Nathasha Kulaththna



කහ ඉර - මහින්ද දිසානායක දිවුල්ගනේ



කවියක් ගඟක් සහ හොරෙක් - ශ්‍රීනාත් මද්දුමගේ



ටොමිය අපිට අපි ටොමියට - ප්‍රසාද් විජේබන්දු



රට ගිය ඇත්තෝ - තාරක තොටවත්තගේ



තොප්පියයි අපියි - ඒ. සුබසිංහ

සේයා රූ - දීපාල් ගුණවර්ධන / උදාර ඩි සිල්වා / මලිත් දේවගේ